# "කළමනාකාර" සේවා ගණයෙහි
# (ආදර්ශ) බඳවාගැනීමේ පරිපාටිය

**ආයතනයේ ලිපි ගොනු අංකය :** **දිනය :**

**කළමනාකරණ සේවා ලිපි ගොනු අංකය :** **දිනය :**

01. **සේවා ගණය :**
"කළමනාකාර"

02. (අ) **"කළමනාකාර" ගණයේ තනතුරු දරන්නන්ට පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචන :-**

පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සාධනය, විධානය / අණ දීම, කළමනාකරණය හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුළත් වූ ද ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ථ කාර්යභාරයේ අන්තර්ගත කාර්යයන් අතර කොටසක් වශයෙන් ගිණිය හැක්කා වූ ද කාර්යයන්

(ආ) සේවා ගණයට අයත් තනතුරු (අදාළ තනතුරු නම් වශයෙන් මෙහි සඳහන් කරන්න. / උපලේඛනයක් වශයෙන් මෙයට ඇතුළත් කරන්න.)

(ඇ) තනතුරට පැවරෙන කාර්යයන්
ඒ ඒ තනතුරට පැවරෙන කාර්යයන් නිශ්චිතව සඳහන් කරන්න.

03. **පත්වීමේ ස්වභාවය සඳහන් කරන්න.**

(ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල / සේවාදායකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත / රහිත ආදී වශයෙන්)

04. **වැටුප් ක්‍රමය, කාර්යක්ෂමතා පරීක්ෂණය හා බඳවා ගැනීමේ ක්‍රමවේදය**

4.1 සේවා ගණයට අදාළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය
MM 1-3 - 2006 : - රු. ( 26,970 - 10 x 645 - 15 x 925 - 47,295)

4.2 සේවා ගණයට අදාළ ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක මාසික වැටුප් පියවර

| ශ්‍රේණිය | අදාළ ශ්‍රේණියේ වැටුප් පියවර | |
|---|---|---|
| II | පියවර 01 | රු: 26,970 |
| I | පියවර 12 | රු: 34,345 |

(සෑම පත්වීම් ලිපියකම වැටුප් කේත අංකය, වැටුප් පරිමාණය හා ශ්‍රේණි ව්‍යුහය සම්පූර්ණයෙන්ම සඳහන් කළ යුතුය. ඒ ඒ සේවා ගණය තුළ ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්

කිරීමේ දී අලුතින් පත්වීමේ ලිපියක් නිකුත් කිරීම අවශ්‍ය නොවන අතර, උසස් කිරීමේ ලිපියක් පමණක් නිකුත් කිරීම සෑහේ)

4.3 සේවක සංඛ්‍යාව

(සේවා ගණය තුළ ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා II හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවට අයත් සේ සළකනු ලැබේ. අනුමත කරණු ලැබ ඇති හෝ වාර්ෂික ඇස්තමේන්තුවල සඳහන් පරිදි සේවා ගණයට අයත් ඒකාබද්ධ සේවක සංඛ්‍යාව නිශ්චිතව සඳහන් කරන්න.)

4.4 කාර්යක්ෂමතා කඩඉම්

4.4.1 II වන ශ්‍රෙණියට පත්ව වසර (03) ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

4.4.2 කාර්යක්ෂමතා කඩඉම් සඳහා වන පොදු ප්‍රශ්ණ පත්‍ර සඳහා වූ අදාල විෂය නිර්දේශය සඳහා පහත 07 ඡේදයේ සඳහන් විෂය නිර්දේශයට අමතරව එක් එක් තනතුරක් සඳහා වන විශේෂ අවශ්‍යතාවයන් ද ආවරණය වන පරිදි විෂය නිර්දේශය සකස් කර ගත යුතුය. ඉහත සඳහන් පරිදි නියමිත කාලය තුළ අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය. ඉහත සඳහන් පරිදි නියමිත කාලය තුළ අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවන තැනැත්තන් පිළිබඳව ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබේ.

4.4.3 අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වත් හෝ අවශ්‍ය වන පරිදි අවශ්‍ය වන විටදී පවත්වනු ලැබේ.

4.5 ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවනට අමතරව රජය විසින් කලින් කල තීරණය කරණු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා හා නිපුණතාවන් ද සියලුම තනතුරුධාරීන් විසින් නිමිත පරිදි ලබා ගත යුතු වේ.

## 05. "කළමනාකාර" සේවා ගණයට බඳවා ගැනීම

**බඳවා ගැනීමේ ක්‍රමය**

පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු පහත සඳහන් විකල්ප අතරින් යෝග්‍ය විකල්පයක් මගින් බඳවා ගැනීම සිදු කරනු ලැබිය හැකිය. (අපේක්ෂිත ක්‍රියා මාර්ගය නිශ්චිතව සඳහන් කරන්න.)

i. විවෘත තරඟ විභාගය හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම

ii. සීමිත තරඟ විභාගයකින් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම මගින්

5.1 මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලුම පත්කිරීම් / බඳවා ගැනීම් මෙම පරිපාටියෙහි විධිවිධානයනට තරයේ අනුකූල වන පරිදි පමණක් විය යුතුය. සෑම බඳවා ගැනීමක් සම්බන්ධයෙන්ම ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ

5.2 බඳවාගනු ලබන්නේ ඉහත කී සේවා ගණයේ II ශ්‍රේණියට පමණී.

**5.3 සේවා ගණයේ II ශ්‍රේණියට බඳවා ගැනීම**

**5.3.1 බාහිර අයදුම්කරුවන් බඳවාගැනීම**

**5.3.1.1 අධ්‍යාපන සුදුසකම් (උදාහරණය)**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක අදාල ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම (අදාළ ක්ෂේත්‍රය සඳහන් කළ යුතුය)

5.3.1.2 වෙනත් (තනතුට / සේවයට අදාළ වන පරිදි අනෙකුත් සුදුසුකම්)

5.3.1.3 වයස අවු: 22 ට නොඅඩු අවු: 28 ට නොවැඩි විය යුතුය.

**5.3.1.4 බඳවා ගැනීමේ ක්‍රම වේදය** - විවෘත තරඟ විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින්

තරඟ විභාගයක හා මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. තරඟ විභාගයේ දී ප්‍රකාශවන කුසලතා අනුපිළිවෙළ අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා අපේක්ෂකයින් කැඳවනු ලැබිය යුතුය. අවසන් වශයෙන් තෝරා ගැනීම විවෘත තරඟ විභාගයේ දී ලද මුළු ලකුණු සංඛ්‍යාවෙන් සියයට පහළොව (15%) නොඉක්මවන සේ බරතැබීමේ පදනමින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දී විවෘත තරඟ විභාගයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල එකතුව මත ප්‍රකාශ වන කුසලතාවය මත සිදු කළ යුතුය.

**5.3.1.5 විවෘත තරඟ විභාගය**

පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්ණ පත්‍රවලට පෙනී සිට අවම වශයෙන් සෑම ප්‍රශ්ණ පත්‍රයක් සඳහාම ලකුණු 40 ක් බැගින් ලබාගත යුතුය.

**5.3.1.6 ව්‍යුහත සම්මුඛ පරීක්ෂණය මගින් බඳවාගැනීමේ ක්‍රමවේදය**

පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සුදුසුකම් ඇති අය අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුශලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම් සිදු කෙරේ.

### 5.3.1.7 සුදුසුකම් ලබන දිනය

සේවයට / තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 5.3.1.1, 5.3.1.2 හා 5.3.1.3 වන වගන්තිවල සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණකි.

### 5.3.1.8 ස්ථිර කිරීම

සේවයේ තනතුරේ II ශ්‍රේණියට පත් කරණු ලබන නිලධාරියෙකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු / ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබේ නම් පරිවාස කාලය අවසානයේදී සේවයේ / තනතුරේ ස්ථිර කරනු ලැබේ.

### 5.3.1.9 බඳවා ගැනීමේ වැටුප

බාහිර අයදුම්කරුවන් අතුරින් බඳවා ගැනීමේදී අදාළ තැනැත්තා වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි පිහිටුවනු ලැබිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි සිදු කරණු ලැබේ.

## 5.3.2 සේවා ගණයේ II ශ්‍රේණියට සීමිත තරඟ විභාගයකින් අභ්‍යන්තර තරඟ කරුවන් බඳවා ගැනීම (යෝග්‍ය අවස්ථාවන්හිදී )

### 5.3.2.1 බඳවා ගැනීමේ ක්‍රම වේදය සීමිත තරඟ විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම

සීමිත තරඟ විභාගයක හා මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

### 5.3.2.2 සුදුසුකම්

(අ) ඒ ඒ තනතුරට / සේවාවට අදාළ වන පරිදි අවශ්‍ය සුදුසුකම් නිශ්චිතව සඳහන් කරන්න. උදාහරණ :-

අදාල සුදුසුකම් ලැබීමේ නිශ්චිත සේවාවක උපාධිධාරියෙකු නොවන තැනැත්තෙක් නම් වසර දහයක (10) සක්‍රීය සේවා කාලයක් හෝ උපාධිධාරියෙකු නම් වසර පහක (05) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ වීම. (සුදුසුකම් ලැබීම සඳහා වන නිශ්චිත සේවාවන් සඳහන් කළ යුතුය.)

(ආ) **අනිවාර්ය සුදුසුකම්**

සුදුසුකම් ලැබීම සඳහා වන සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයා ගෙන තිබිය යුතු අතර, එම කාලය තුළ විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතුය.

**5.3.2.3 සීමිත තරඟ විභාගය**

පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන බලධරයකු විසින් තරඟ විභාගය පවත්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්ණ පත්‍රවලට පෙනී සිට සෑම ප්‍රශ්ණ පත්‍රයක් සඳහාම අවම වශයෙන් ලකුණු 40 බැගින් ලබා ගත යුතුය.

**පත්වීම ලබාදීම සඳහා තෝරා ගැනීම**

පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් තහවුරු කර ගැනීමෙන් පසුව ලිඛිත විභාගයෙන් ප්‍රකාශ වන කුශලතා අනුපිළිවෙළ මත තෝරාගනු ලැබිය යුතුය.

**5.3.2.4 අභ්‍යන්තර අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් බඳවාගැනීමේ ක්‍රමවේදය**

පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සුදුසකම් ලැබූවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

**5.3.2.5 ස්ථිර කිරීම**

අභ්‍යන්තර අයදුම්කරුවන් වශයෙන් බඳවාගනු ලබන තැනැත්තන් සේවයට පත් කිරීමේ දී වැඩ බැලීමේ පරීක්ෂණ කාල සීමාවක් නියම කරනු ලැබිය හැක.

**5.4 බඳවාගනු ලබන සේවක අනුපාතය**

විවෘත තරඟ විභාගයක් හා සීමිත තරඟ විභාගයක් මගින් බඳවාගන්නා විට විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සහ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත බඳවාගනු ලබන ප්‍රතිශතය පැහැදිළිව සඳහන් කළ යුතුය. බඳවා ගත යුතු සංඛ්‍යාව වනුයේ කිසියම් වර්ෂයක ජුනි මස 30 වන දිනට සහ දෙසැම්බර් මස

31 දිනට සේවයෙහි සමස්ථ සේවක සංඛ්‍යාව තුළ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වේ.

**5.5 විභාග සඳහා පෙනී සිටීම**

4.5.1 විවෘත තරඟ විභාගය හෝ සීමිත තරඟ විභාගය යන දෙකෙන්ම ඕනෑම විභාගයක් සඳහා එක් අපේක්ෂකයෙකුට උපරම වශයෙන් දෙවරක් පෙනී සිටිය හැක.

**06. උසස්වීම්**

කාර්යසාධනය පදනම් කර ගත් පහත දැක්වෙන ආකාරයේ උසස්වීම් ක්‍රමයකින් සමන්විත වේ.

6.1 සේවා ගණයෙහි II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

6.1.1 සාමාන්‍ය මට්ටමේ කාර්යසාධනය පෙන්නුම් **කරන්නන් :-**

**(අ) පූර්ව අවශ්‍යතා**

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර (10) තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iv උසස්වීම් දිනට පූර්වාසන්නම වසර (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම. නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

vi. අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

vii සේවයේ අවශ්‍යතාව අනුව වෙනත් සුදුසුකම් අවශ්‍ය වන්නේ නම් එම සුදුසුකම් නිශ්චිතව සඳහන් කරන්න.

**(ආ) උසස් වීමේ ක්‍රමය**

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරණු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම් පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

5.1.2 සුවිශේෂී කාර්යසාධනය පෙන්නුම්කරන්න්

(අ) පූර්ව අවශ්‍යතා

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ අදාල කාලයට නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ වසර (06) තුළ සුවිශේෂී කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iv උසස්වීම් දිනට පූර්වාසන්නම වසර (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනයේ දී සමත් වී තිබීම

vi. අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

vii සේවයේ අවශ්‍යතාව අනුව වෙනත් සුදුසුකම් අවශ්‍ය වන්නේ නම් එම සුදුසුකම් නිශ්චිතව සඳහන් කරන්න.

(ආ) උසස්වීමේ ක්‍රමය

පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉන් සමත්වන්නන් විසින් පත්වීම් බලධරයා වෙත නියමිත ආකෘති පත්‍රය මගින් ඉල්ලීමක් කරණු ලැබූ විට, පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් පසු අදාල සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති සේවකයින් පත්වීමේ දින සිට වසර 06 ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරම පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

(ඇ) අභියෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම්

සේවයේ II ශ්‍රේණියේ සේවා කාලය ආරම්භ වන දින සිට අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව අඛණ්ඩව වසර (05) ක සේවා කාලයක් සුවිශේෂී කාර්යසාධනය පෙන්නුම් කරන තැනැත්තන් සේවා කාලය වසර (05) සම්පූර්ණ වූ දින සිට අභියෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති. මෙම පරීක්ෂණය සඳහා එක් සේවකයෙකුට පෙනී සිටිය හැක්කේ එක් වතාවක් පමණී.

(ඇ) සම්විම සඳහා අවම වශයෙන් 50% ක් වත් ලකුණු ලබාගත යුතුය.

## 06. සේවයේ සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම

නව බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මගින් ලබා දී ඇති MM 1-3 : 2006 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන සේවකයින් සියලු දෙනාම එකී දින වන විට ලබා සිටි ශ්‍රේණිය පදනම් කොට ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපි වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

**MM 1-1 - II ශ්‍රේණිය**

(අ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 යටතේ MM 1-3 - 2006 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර නියමකර ඇති තනතුරක අවම වශයෙන් වසර දහය (10) ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්

සහ

ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර දහයක (10) ක සේවා කාලයක් සම්පූර්ණ කළ ද, I ශ්‍රේණියට උසස් කරනු ලැබීම සඳහා වන සෙසු අවශ්‍යතා සම්පූර්ණ නොකළ නිලධාරීන්

MM 1-3 - II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම නව බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීම් පරිපාටිය අනුව උසස් කරනු ලැබීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්

සහ

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 මගින් MM 1-3- 2006 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර නියමකර ඇති තනතුරක් දරණ නිලධාරීන්

MM 1-3 : 2006 හි I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

## 07. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය :-

**අනිවාර්ය විෂයයන් :-**

7.1 **පළමුවන කාර්යක්ෂමතා කඩඉම සඳහා**

අ) පිරිස් පාලනය - පරිපාලන ක්‍රම වේදය

ආ) මූල්‍ය කළමනාකරණය

ඇ) කළමනාකරණය (පොදු)

ඉ) තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ මූලික දැනුම
( ඒ ඒ සේවයට / තනතුරට අදාළ වන පරිදි විශේෂ විෂය සංරචකයන් වෙනම ඇතුළත් කරන්න)

**08. සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස්වීම් විභාග සඳහා විෂය නිර්දේශය ඒ ඒ සේවාවට සුදුසු පරිදි ඇතුළත් කළ යුතුය.**

(අ) **අභියෝග්‍යතා පරීක්ෂණය**

පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන ආකාරයට අදාළ නිලධාරියාට පැවරෙන සියලු කාර්යයන් සාමාන්‍ය කාර්යක්ෂමතා මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවකින් ඉටු කිරීම සඳහා අවශ්‍ය දැනුම, කුශලතා සහ ආකල්ප අත්පත් කර ගෙන තිබේ ද යන්න පිළිබඳ මැනබැලීමේ ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකි.

(ආ) සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 50% ක් ලබා ගත යුතුය.

(ඇ) සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස්වීම් පරීක්ෂණය වර්ෂයකට එක් වරක් වත් පවත්වනු ලැබේ.

**09. අර්ථ නිරූපන**

9.1 මෙම බඳවාගැනීම් පරිපාටියට අදාළ කාර්යයන් සඳහා **" සතුටුදායක සේවා කාලය "** යනුවෙන් අදහස් කරනුයේ උසස්වීම් සඳහා ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න සේවා කාලය තුළ යෙදුනු සියලුම වැටුප් වර්ධක ලබා ඇත්තාවූ ද, ඒ කාලය තුළ කළ වරදකට (අවවාද කිරීමක් හෝ තදින් අවවාද කිරීමක් හැර) දඬුවම් ලබා නැත්තාවූද සේවා කාලයකි.

9.2 **"නියමිත දිනය"** යනුවෙන් අදහස් කරනුයේ මෙම සේවයට / බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය වේ. (නිශ්චිත දිනය සඳහන් කරන්න)

(බඳවාගැනීම් පරිපාටියේ අවශ්‍යතා සඳහා භාවිත යෙදුම් පිළිබඳ තවදුරටත් අවශ්‍ය වන පරිදි අර්ථ නිරූපණ සපයන්න)

**10. පත්වීම් බලධාරියා**

පත්වීම් බලධාරියා කවරෙදැයි නිශ්චිතව සඳහන් කරන්න.

අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන                                        දිනය :
(නිල මුද්‍රාව)

නිර්දේශය කරමි

රේඛීය අමාත්‍යාංශයේ ලේකම් ගේ අත්සන                        දිනය :
(නිල මුද්‍රාව)

අනුමත කරමි.

කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්                                   දිනය :
(නිල මුද්‍රාව)